# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,324 — 1937ක්වූ ඔක්තෝබර් මස 15 වෙනි දිනවූ සිකුරාද.

## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම්.

**Nuwara Eliya No. 88.**—මධ්‍යම දිසාවේ නුවරඑළියේ උප ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට මේ 1937ක්වූ දෙසැම්බර් මස හතරවෙනි දිනවූ සෙනසුරාද උදේ 10ට නුවරඑළියේ කච්චේරියේදී වෙන්දේසියර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. මධ්‍යම දිසාවේ නුවරඑළිය පලාතේ උඩහේවාහැට කොඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 3ක්.

මුල් සිතියමේ නො. A 429. ගම—මාර්තුවෙල. අයිතිකම්කියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහන, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| 1 | දඹගොල්ලේ-ඇල්ල | — .. | තේ, රූක්වුඩ් වතු කොම්පැනිය විසින් අල්ලගෙන තිබෙන කොටස | 0 0 32 | —* |
| 2 | එම .. | ජේ. ආර්. ආම්ස්ට්‍රෝං, රූක්වුඩ් වත්තේ සුපරින්ටැන්ඩන්ට් | කැලෑව .. .. | 0 1 27 | 115† |
| 3 | එම .. | — .. | තේ, රූක්වුඩ් වතු කොම්පැනිය විසින් අල්ලාගෙන තිබෙන කොටස | 0 0 11 | —* |

* ආණ්ඩුවේ සාමාන්‍ය ව්‍යවස්ථා නොම්මර 812 යටතේ බේරීමට. † ප්‍රසිද්ධ වෙන්දේසියේ.

මෙම ඉඩම් ගැන වැඩිදුර තොරතුරු නුවරඑළියේ උප ඒජන්තතුමාගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

මේ 1937ක්වූ ඔක්තෝබර් මස 13වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

එච්. ඊ. ජූන්ස්,
වැඩබලන ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුව.

---

**No. 12,626, S. O.**—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට මේ 1937ක්වූ දෙසැම්බර් මස 1වෙනි දිනවූ බදාදා පෙරවරු 10ට කොළඹ ආණ්ඩුවේ ඉඩම් නිරවුල්කරන කන්තෝරුවේදී වෙන්දේසියර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. බස්නාහිර පලාතේ කළුතර දිස්ත්‍රික්කයේ නැගෙනහිර පස්දුන්කෝරළේ උතුරු මහපත්තුවේ කොඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 4ක්.

ලංකාමැනීමේ මුල් සිතියමේ නො. 131. ගම—ලත්පඳුර.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකම්කියන්නා. | අන්දම. | මහන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 677 | ගුරුකන්දේදෙනිය .. | කොළඹ බගතලේ පාරේ "හොස්ලී" නිවසේ පදිංචි ජේම්ස් පීටර් ප්‍රනාන්දු | රබර් (පාරට ඉතිරි කර තිබෙන බිම) | 0 0 23* |
| 753 | කැකුණඇලඹිටිය .. | ඩැල්කිත්වත්ත අයිතිකාරවරු, කොළඹ ගොඩන් පාරේ නො. 77 දරණ නිවසේ පදිංචි ඇන්ඩර්සන් සහ සමාගමේ මහත්වරු, ඒජන්තවරු | එම (එම) .. | 0 0 38* |
| 811 | අළුත්වත්ත .. | කිරිවානකැටියවත්ත අයිතිකාරවරු, (මහගම රබර් සමාගම) කොළඹ සීමාසහිත බොසන්කට් සහ ඉස්කුයින් සමාගම, ඒජන්තවරු | රබර් .. | 3 0 18 |

| අංක. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | වපසරිය; අ. රූ. ප. |
|---|---|---|---|---|
| 812 | අරන්මිත්ත .. | මාදෙලවත්තේ අයිතිකාරවරු, (ශ්වොගම රබර් සමාගම) කොළඹ මැක්වුඩ් සහ සමාගම, ඒජන්තවරු | රබර් | .. 16 1 31 |

* බදුදීමට පමණයි.

තක්සේරු මිල අක්ෂරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම් හැඟ වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කාරක නිලධාරීතුමාගෙන්ද, ඒමාගේ සිතියම කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වම් 1937ක්වූ ඔක්තෝබර් මස 11වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

එම්. ඒ. ජූන්ස්,
වැඩබලන ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

No. 12,627, S. O.—ඉඩම් නිරවුල්කිරීමේ නිලධාරීතුමා විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වම් 1937ක්වූ දෙසැම්බර් මස 1වෙනි දිනවූ බදාදා පෙරවරු 9.30ට කොළඹ ආණ්ඩුවේ ඉඩම් නිරවුල් කරන කන්තෝරුවේදී වෙන්දේසියක විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන ක්‍රමයකින් නිත්‍යකරන්ට යෙදෙනවා ඇත. බස්නාහිර පලාතේ කළුතර දිස්ත්‍රික්කයේ හැවගම්කෝරළේ පස්දුන්කෝරලේ දකුණු මහ පත්තුවට කොටසගේ පිහිටා තිබෙන බිම්කැබලි 1ක්.

ටෝපෝ මූල් සිතියමේ අංක. 1. (කුඩා සිතියමේ අංක. 12). ගම—කලුගන්දුව.

| අංක. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා හෝ අයිතිකාරකියන්නා. | අන්දම. | වපසරිය; අ. රූ. ප. |
|---|---|---|---|---|
| 78 | කොළඹකන්දේහේන .. | (1) කොටහේනේ වෝල් පාරේ පදිංචි සිම්හිරිආරච්චිගේ දොන් විලියම් රොබට් නානායක්කාර, (2) කොටහේනේ විලියම් පාරේ අංක. 127හි පදිංචි පී. ලැස්ලි පෙරේරා | හේන | .. 12 3 23 |

තක්සේරු මිල අක්කරයක් රුපියල් 100කට වැඩිනොවන මුදලක් වේ.

මෙකී ඉඩම හැඟ වැඩිදුර තොරතුරු කොළඹ ඉඩම් බේරුම්කාරක නිලධාරීතුමාගෙන්ද, ඒගේ සිතියම කොළඹ සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැකිවේ.

වම් 1937ක්වූ ඔක්තෝබර් මස 11වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

එම්. ඒ. ජූන්ස්,
වැඩබලන ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වම් 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3වන් ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කවශ්‍යත්තෘට, ඒනම්:—වැස්ටර් සිටන් සිංහල මිශ්‍ර පාඨශාලාව පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකාරක පිණිස "වම් 1876ගේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හතරවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩුකාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලයයිට නිසිආකාර ඔව අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ අංක. A 741. ගම—කදිරන උතුර.

| අංක. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | වපසරිය; අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | වැස්ටර් සිටන්වත්ත .. | අවුරුද්දක් වයස පොල්පැල 66ක්ද, අවුරුදු 10ක් වයස පොල්ගසක්ද, අවුරුදු 10ක් වයස කිතුල්ගස් 2ක්ද, අවුරුද්දක් වයස කොස්පැල 3ක් සහ කුරුදු පඳුරු කට්ටිවලින් යුත් පොල්වත්තක කොටසක් | ඇස්. ඩී. ඇස්. ගුණසේකර, වැස්ටර් සිටන්වත්ත, කදිරන උතුර | 1 0 1·5 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව ප්‍රසිද්ධකර දැනගැන්ම සඳහා හත්වෙනි වගන් තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ට නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වම් 1937ක්වූ නොවැම්බර් මස 15වෙනි දින පෙරවරු 10ගේ කාහිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වම් 1937ක්වූ ඔක්තෝබර් මස 11වෙනි දින කොළඹ කච්චේරියේදීය.

කේ. දෙවනායගම්,
ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුවට.

---

වම් 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3වන් ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කවශ්‍යත්තෘට, ඒනම්:—වැලිබොඩ සවහාන ගැහැනු පාඨශාලාවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැණීම සඳහා ක්‍රියාකාරණ පිණිස "වම් 1876ගේ ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ" හතරවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩුකාරක මන්ත්‍රණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට නිසිආකාර ඔව අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ අංක. A 746. ගම—වැලිබොඩ.

| අංක. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | වපසරිය; අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කැකුනගහවත්ත | අවුරුදු 40ක් වයස පොල්ගස් 21ක්ද, අවුරුදු 6ක් වයස කොස්ගස් 3ක් සහ අවුරුද්දක් වයස කොස්පැලයකින් යුත් පොල් ඉඩම | ඇම්. දොන් සේදිරිස්, වැලිබොඩ පොලිස් විදානෙ | 0 3 12·6 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව ප්‍රසිද්ධකරයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන් තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වම් 1937ක්වූ නොවැම්බර් මස 15වෙනි දින පෙරවරු 10ගේ කාහිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වම් 1937ක්වූ ඔක්තෝබර් මස 11වෙනි දින කොළඹ කච්චේරියේදීය.

කේ. දෙවනායගම්,
ආණ්ඩුවේ උප ඒජන්ත වෙනුවට.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කාවශ්‍යත්තකට; එනම්:—ඕහර ගුවන්පලටක් පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" 6වෙනි කාණ්ඩයේ සරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩුකාරතුමා සභාවට උතුමාණන්වහන්සේගේ පැවරී තිබෙන බලය පිට නීතිඅනුකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. A 758. ගම—කුරුණෑගොඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | තිස්සගහවත්ත .. | අවුරුදු 50ක් වයස පොල්ගහක්ද, අවුරුදු 4ක් වයස පුවක්ගස් 3ක් සහ වෙසක්වැඩකරන ලද උළුසෙවිලි ගොඩනැගිල්ලකින් යුත් පොල්ඉඩම, (අඩබලම) | අමරසිංහලේකම්ගේ දොන ලියනෝර ගාමිණිගේ, ඕහර, කුරුණෑගොඩ | 0 0 14·1 |

එබැවින් ඉඩම අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1937ක්වූ නොවැම්බර් මස 15වෙනි දින පෙරවරු 10යේ කාතිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්දැයි කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකාරම් තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර් 1937ක්වූ ඔක්තෝබර් මස 11වෙනි දින කොළඹ කච්චේරියේදීය.

කේ. වෛත්‍යනාදන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කාවශ්‍යත්තකට; එනම්:—ගල්බඩවේ මුස්ලිම් පාඨශාලාවක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" 6වෙනි කාණ්ඩයේ සරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් ආණ්ඩුකාරතුමාණ සභාවට උතුමාණන්වහන්සේගෙන් පැවරී තිබෙන බලය පිට නීතිඅනුකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

මුල් සිතියමේ නො. A 745. ගම—ගල්බඩව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | පරගහවත්ත .. | අවුරුදු 40ක් වයස පොල්ගස් 66ක්ද, අවුරුදු 5ක් වයස පොල්පැල 5ක්ද, අවුරුදු 30ක් වයස කොස්ගහක්ද, අවුරුදු 4ක් වයස අඹ ගස් 2ක්ද, අවුරුදු 30ක් වයස පුවක්ගස් 12ක් සහ අවුරුදු 5ක් වයස පුවක්ගස් 11කින් යුත් පොල්ඉඩම | ඇස්. ඒ. කේදර් මොහිදීන්, ගල්බඩව | 1 0 0·6 |
| 2 | එම .. | අවුරුදු 4ක් වයස පුවක්ගස් 2කින් යුත් ඉඩම .. | එම .. | 0 0 4·7 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1937ක්වූ නොවැම්බර් මස 15වෙනි දින පෙරවරු 11යේ කාතිසමට මෙම කන්තෝරුවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්දැයි කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකාරම් තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර් 1937ක්වූ ඔක්තෝබර් මස 11වෙනි දින කොළඹ කච්චේරියේදීය.

කේ. වෛත්‍යනාදන්,
ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට; ආණ්ඩුවේ කාවශ්‍යත්තකට; එනම්:—අයිපාරට සහ අවට තිබෙන ඉඩම්වලට යෑම ඒම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ සරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් නීතිඅනුකාර මට අණලැබී තිබේ; ඒ ඉඩම් නම්:—

සිතියමේ නො. A 511. ගම—කුඹලගමුව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කුලවත්තන්ද නොහොත් කොහොල්ගස්හේන | අවුරුදු 8ක් වයසැති පොල්ගහක් ඇති මුඩුබිම .. | ගාල්ලේ පදිංචි සී. ඩබ්ලිව්. ගුණවර්ධන මහත්මයා | 0 0 1·9 |
| 2 | පල්ලියදෙනිය .. | අවුරුදු 8ක් වයසැති පොල්ගහක් සහ රබර්ගස් 53ක් ඇති ඉඩම | ඉහලගොඩපදිංචි පී. ඩබ්ලිව්. ගුණවර්ධන මහතා | 0 0 27·3 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1937ක්වූ නොවැම්බර් මස 10වෙනි දින පෙරවරු 10යේ කාතිසමට ගාල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්දැයි කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකාරම් තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර් 1937ක්වූ ඔක්තෝබර් මස 11වෙනි දින ගාල්ලේ කච්චේරියේදීය..

ඒ. සී. ඇම්. හින්ස්ලි,
ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොවැම්බර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කාවශ්‍යත්තකට, එනම්:—අයිපාරට සහ අවට තිබෙන ඉඩම්වලට යෑම ඒම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හවෙනි කාණ්ඩයේ සරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් නීතිඅනුකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම් නම්:—

තවී සිතියමේ නො. 658. ගම—ඉහලගොඩ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 469 | කොහොල්ගස්හේන .. | අවුරුදු 16ක් වයසැති තේ පඳුරු 95ක්ද, පොල් ගස් 4ක්ද, අඹගසක් සහ දෙහිගසක් තිබෙන ඉඩම, අවුරුදු 10ක් වයසැති | ඉහලගොඩ පදිංචි පී. ඩබ්ලිව්. ගුණවර්ධන මහතා | 0 0 5·7 |
| 470 | — .. | අයිපාර .. .. .. | එම .. | 0 0 4·6 |
| 471 | කොහොල්ගස්හේන .. | අවුරුදු 16ක් වයසැති තේ පඳුරු 31ක් සහ අවුරුදු 8ක් වයසැති පොල්ගහක් ඇති ඉඩම | එම .. | 0 0 3·7 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1937ක්වූ නොවැම්බර් මස 10වෙනි දින පෙරවරු 10යේ කාතිසමට ගාල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්දැයි කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතිකාරම් තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර් 1937ක්වූ ඔක්තෝබර් මස 11වෙනි දින ගාල්ලේ කච්චේරියේදීය.

ඒ. සී. ඇම්. හින්ස්ලි,
ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3 දරන ආඥාපනතේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—ගොනාකොරවල පාඨශාලාවට ක්‍රීඩාභූමියක් සෑදීම පිණිස පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරන පිණිස "වර්ෂ 1876 ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ" හයවෙනි භාගයේ සඳහන් කර තිබෙන පංගාර්තුවල ප්‍රකාරයට ක්‍රියාකරන්න ආණ්ඩුකාරතුමාණන් වහන්සේගෙන් නියමාකාරයට අණ ලැබී තිබේ, ඒ ඉඩම නම්:—

සිතියමේ නො. A 568. ගම—පරවාහැර.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයින්ගේ නම, | වගන, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | දෙනියගහඕවත්ත | අවුරුදු 25ක් පමණ වයස ඇති පොල්ගස් 12ක්ද, අවුරුදු 12ක් පමණ වයස ඇති පොල්ගස් 12ක්ද, අවුරුදු 5ක් පමණ වයස ඇති පොල්ගස් 17ක්ද, අවුරුදු 40ක් පමණ වයසැති කොස්ගස් 3ක්ද, අවුරුදු 4ක් පමණ වයස ඇති කජුගහක්ද සහ අවුරුදු 6ක් පමණ වයස ඇති කුරුඳුපඳුරු 55ක්ද ඇති පොල්වත්ත | යටියන පදිංචි බී. ඒ. රනවීර | 0 2 1·1 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇතැයි කියාපාන සියලුදෙනාම තමුන්ම හෝ ඇටෝර්නි කෙනෙකු මගින් හෝ වර්ෂ 1937ක්වූ නොවැම්බර් මස 20වෙනි දින පෙරවරු 10 පැයට මාතර කච්චේරියේදී මා ඉදිරියට පැමිණ ඒ ඉඩමට තමුන්ට ඇති අයිතිවාසිකම්ද ඉඩම ගැනීමට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇති වූ හැටිත් තමුන්ගේ අයිති කර ඇති තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1937ක්වූ ඔක්තෝබර් මස 12වෙනි දින මාතර කච්චේරියේදීය.

ඇස්. සී. කුමාරස්වාමි,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත වරයා.

---

## ආණ්ඩුවේ රබර් ඉඩම් බදුදීම

සබරගමු පලාතේ රත්නපුර දිස්ත්‍රික්කුයේ පිහිටි මෙහි පහත සඳහන් රජයේ සන්තක රබර් ඉඩම්වල 1937 දෙසැම්බර් මස 31වෙනි දින දක්වා කිරිකපා ප්‍රයෝජන ගැනීමේ බලය ඉල්ලා එවන්ට යෙදෙන ඉල්ලුම්පත්‍ර සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් බාරගනු ලැබේ. මෙම ඉඩම් ආණ්ඩුව විසින් රිජිස්ටර්කර තිබේ. තවද 1937 ඔක්තෝබර් අවුරුද්දට කුපන් ගෙවන්ට තිබේ. නො. 8 ඉඩමට අවුරුද්දේ කොටසක කුපන් ගෙවන්ට තිබේ.

2. "Tenders for the right to take the produce of rubber trees" එනම් "රබර්ගස්වල කිරිකපා ප්‍රයෝජන ගැනීමට බලය ඉල්ලුම්කරන ඉල්ලුම්පත්‍රය" යන වචන ඇන්වලෝප් එකේ මතුපිට ලියනලද මුද්‍රලත් ඉල්ලුම්පත්‍ර වර්ෂ 1937ක්වූ නොවැම්බර් මස 1වෙනි දින පෙරවරු 10ය වනතුරු භාරගනිමින් කඩාබලයාවා ඇත. ඉල්ලුම්කාරයෝ ඉදිරිපිට සිටින්ට ඕනෑය. එසේ නැත්නම් නීති බලයලත් ඒජන්ත කෙනෙකු හෝ ඒජන්තවරු ලවා ඉල්ලු පත්‍ර හරි ඒවා ඔව ඔප්පුකරන්ට ඕනෑය.

3. ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්නාලද ඉල්ලුම්පත්‍ර අයිතිකාරයෝ ඉල්ලුම්පත්‍රවල සඳහන් මුදල් සම්පූර්ණයෙන් එකවිගල්ම ගෙවන්ට ඕනෑය. තවද කොන්දේසි පිළිපැදීම් ආදිය සඳහා බදු අවසර පත්‍රයකට ඇතුල්වෙන්ට ඕනෑය.

4. එක එක ඉඩමට වෙන්වෙන් වශයෙන් ඉල්ලුම්පත්‍ර එවන්ට ඕනෑය.

5. ඉඩම කැලෑවටයන්ට නොදී තබාගැනීමට බදුකාරයා බැඳිය යුතුයි.

6. උවමනාකරණ කානු සහ වලවල් ආදිය කපා ඉඩමේ පස්සෝද දෙලවල්වලට යාව වැලැක්විය යුතුයි.

7. ඒජන්ත උන්නාන්සේගේ බලය ඇති යම් කෙනෙකුට බද්ද අවසානයේදී බදුකාරයා විසින් ඉඩම නිරවුල්ව බාරදිය යුතුයි.

8. මෙම ඉඩම්වල කිරි ප්‍රමාණය පෙන්නුම්කර තිබෙන්නේ සාමාන්‍ය වශයෙනි. යම් අන්දමකින් ඉඩම්වල හරි සම්පූර්ණ කිරි ප්‍රමාණය මෙහි පහත සඳහන් කිරි ප්‍රමාණයට වඩා අඩුබව දෙවනු පෙනීගියහොත්, එම වෙනස සියයට 10ක් (10%) වැඩි නුනිනම් කිරි ප්‍රමාණයේ අඩුලුහුඩුකම් සම්බන්ධව මුදල් ආපසු ගැනීමට හෝ අඩුකර ගැනීමට කරණ ඉල්ලීම ආණ්ඩුව විසින් කල්පනාවටගනු නොලැබේ.

9. වැඩිදුර කාරනා සබරගමු පලාතේ ඒජන්ත උන්නාන්සේගෙන් ලබාගත හැක.

වර්ෂ 1937ක්වූ ඔක්තෝබර් මස 9වෙනි දින රත්නපුරේ කච්චේරියේදීය.

ආර්. ඇස්. වී. පෝලියර්,
සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ වරයා.

ඉඩම්වල තොරතුරු.

| නො. | රෙජිස්ටර් නො. | කෝරලය. | ගම. | ඉඩමේ විස්තර, සිතියමේ නො. | ලොට් නො. | කිරිප්‍රමාණය, අ. රූ. ප. |
|---|---|---|---|---|---|---|
| 1 .. | 193 E 3 R 42 .. | කුකුල් .. | අයගම .. | 42 .. | 56 .. | 14 0 7 |
| 2 .. | 193 E 3 R 43 .. | එම .. | එම .. | 42 .. | 53 .. | 21 2 31 |
| 3 .. | 193 E 3 R 44 .. | එම .. | එම .. | 42 .. | 59 සහ 83 .. | 36 0 0 |
| 4 .. | 193 E 3 R 45 .. | එම .. | එම .. | 42 .. | 147 සහ 149 .. | 10 1 30 |
| 5 .. | 193 E 3 R 46 .. | එම .. | එම .. | 42 .. | 164 සහ 165 .. | 105 2 11 |
| 6 .. | 193 E 3 R 47 .. | එම .. | එම .. | 42 .. | 174 සහ 184 .. | 125 0 0 |
| 7 .. | 193 E 3 R 48 .. | එම .. | එම .. | 42 .. | 681 .. | 10 0 0 |
| 8 .. | 160 E 1 R 18 සහ 19 | කුරුවිටි .. | බටගොව .. | 355 .. | 111, 125, 127, 127A, 127B, 127C, 127D, 127E, 130, 130A, 130B 130F, 130G, 130H, 131A, 131B සහ 131E | 41 1 28 |

---

## ටෙන්ඩර්ස් නම් ඉල්ලුම්පත්‍ර පිළිබඳ දැන්වීම.

L H 867

### තණ කැපීම පිණිස බදුදෙන ඉඩම්.

මෙහි පහත සඳහන් කොන්දේසිවලට යටත්ව වර්ෂ 1938ක්වූ ජනවාරි මස 1වෙනි දින සිට අවුරුද්දකට පහත සඳහන් ඉඩමේ තණකොළවල බද්ද මිලේට ගැනීම පිණිස එවනු ලබන ඉල්ලුම්පත්‍ර බස්නාහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්නවා ඇත.

සීල් තබා එවනු ලබන ඉල්ලුම්පත්‍ර වර්ෂ 1937ක්වූ නොවැම්බර් මස 5වෙනි දින සිකුරාදා දවල් 11 වනතුරු කොළඹ කච්චේරියේදී භාරගෙන එම වේලාවට කඩාබලනු ලැබේ. ඉල්ලුම්පත්‍ර එවනු ලබන සියලුදෙනාම එම ඉල්ලුම්පත්‍ර සැබෑවූ ඒවා බව ඒජන්ත උන්නාන්සේට ඒත්තුගැනීම පිණිස තමන් හෝ තමන් වෙනුවෙන් ඊට නීති බලයලත් අයෙක් එම වේලාවට පෙණීසිටින්ට ඕනෑය. ලේඛනයේ දෙවෙනි කොටුවේ දක්වන ප්‍රකාර ඉල්ලනු ලබන ඉඩමේ නම පිට කවරවල සලකුණුකොට ඉල්ලුම්පත්‍ර නොයොත් ටෙන්ඩර්ස් එවිය යුතුයි.

1. බදු මිල සම්පූර්ණයෙන් පෙන්ගේසි දවසේදීම ගෙවිය යුතුයි.

2. මිලේට්ගත් අයගේ අයිතිවාසිකම තණකොළ ප්‍රයෝජනය පමණකි.

3. මිලේටගත් අය හෝ ඔහුගේ වැඩකරුවන් විසින් හෝ කිසිම ගසක් කැපීම හෝ වැටක් හෝ මායිමක් වෙනස්කිරීම තහනම්ය.

4. මිලේට්ගත් අය විසින් එම ඉඩම යහපත්ලෙස පිරිසිදුව තබාගතයුතුවා පමණක්නොව නාගරික සභාවේ අණපණත්වලට එකඟව වරිපනම් ආදි සියළුම අයබදු ගෙවන්ටද ඕනෑය.

5. කිරිඑලදෙනුන්ට, මීදෙනුන්ට හෝ මීහරකුන්ට තණ කෑමට අවකාශ දියයුතු නොවේ. එසේ තණ කෑමට ඉඩ හරිනුලැබූ සතුන් ඇල්ලීමට බදු දීමනාකාරයාට හෝ එතුමාගෙන් නිසි බලයලත් අයෙකුට අවසර තිබේ. නාගරික මූලාදෑනීන්ට මෙකී තහනම අනුව ක්‍රියාකිරීමට බදුකාරයා ඉඩදෙන්ට ඕනෑය.

6. තණ කෑවීමට ඉඩහරිනු ලැබූ සතුන් මහපාරේ දඩාවතේ නොයනලෙස වගබලාගත යුතුයි.

7. මේ ඉඩමේ සවස 6.30 සිට උදේ 6 දක්වා හරක්වතණ කෑම පිණිස ලිහාදමන්ට හෝ බැඳතියන්ටවත් අවසර නැත.

8. බස්නාහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගේ අවසර ඇති ලියවිල්ලක් නොමැතිව එම බද්ද වෙන කෙනෙකුට පවරාදීම හෝ විකිණීම හෝ කොටස්කිරීම තහනම්ය.

9. ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් එම ඉඩම්වල වැටවල් බඳින්ට නියමකළොත් මිලේට්ගත් අය විසින් එසේ කළයුතුය.

10. බද්ද අවසානවෙන්ට පෙර එම ඉඩම සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් ආණ්ඩුවට උවමනාකළොත් සතියක් කල් ඇතුව ලියවිල්ලකින් දන්වාදුන්විට ආණ්ඩුවට භාරදිය යුතුයි. ආණ්ඩුව විසින් බුක්තිය භාරගනුලැබූ ඉඩම් කට්ටියේ හෝ ඉඩම්වල ඉතිරි බදුකාලයට වැටෙහෙන බදු මුදල නැවත මිලේට්ගත් අයට ගෙවනවා ඇත.

11. මෙම ඉඩමේ තණකොළ වැවීම තහනම්.

12. ඉහතකී කොන්දේසි කඩකළොත් එම ඉඩම්වල බුක්තිය භාරගෙන මිලේට්ගත් අය හෝ ඔහුගේ වැඩකරුවන් එම ඉඩම්වලින් අස්කිරීමට ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

13. එක ඉල්ලුම්පත්‍රයක් හෝ සියලුම ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

ඩබ්ලිව්. ඊ. ගොඩ්බේ,
බස්නාහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ වෙනුව.

වර්ෂ 1937ක්වූ ඔක්තෝබර් මස 15වෙනි
දින කොළඹ කච්චේරියේදීය.

ඉහතකී විස්තර ලේඛනය.

| 1. කඩදාසි නො. | 2. ඉඩමේ විස්තර. | 3. පිහිටීම. |
|---|---|---|
| L.H.867 .. | නොම්මර 17,149 දරණ පලෑතේ පෙන්නුම්කර තිබෙන අක්කර හතරක් පමණ විශාලකම ඇති බිම්කට්ටි 1 සහ 2න් කැල්ලක් | දෙමටගොඩ |

L H 877

මෙහි පහත සඳහන්කරණ ආණ්ඩුවේ ඉඩම වර්ෂ 1938ක්වූ ජනවාරි මස 1වෙනි දින පටන් අවුරුදු දෙකකට බදුදීමට ඉල්ලුම්පත්‍ර බස්නාහිර දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්නා බව මෙයින් දන්වාදෙනු ලැබේ.

මෙම මුද්‍රකරණලද ඉල්ලුම්පත්‍ර වර්ෂ 1937ක්වූ නොවැම්බර් මස 5වෙනි සිකුරාදා දවල් 11වනතුරු කොළඹ කච්චේරියේදී භාරගෙන එදිනදී ඒවා කඩා බලනවා ඇත. ඉල්ලුම්පත්‍ර සැබෑ බවට ඔප්පුවීමට ඉල්ලුම්කරන්නාවූ සියලුදෙනාම ඒජන්ත උන්නාන්සේ ඉදිරියේ තමන්ම නොහොත් තමන් වෙනුවෙන් ක්‍රියාකරන්නෙක් පෙණීසිටින්ට ඕනෑය.

කොන්දේසි.

1. බදුමිල සම්පූර්ණයෙන්ම වෙන්දේසි දවසේදීම ගෙවිය යුතුයි.

2. කිරිල්ලපොනේ ඇළේ යන එන පහුරු, පාරු යනාදියෙන් බඩු බෑමටත්, පැටවීමටත් ඉඩම පාවිච්චිකිරීමට බදුකාරයාට බලය තිබේ. එක පාරුවකට හෝ පහුරකට රුපියලකට වැඩිනොවන ගණනක් අයකිරීමට බදුකාරයාට බලය තිබේ.

3. දැනට පවතින යම් වැටක් හෝ මායිමක් වෙනස්කරන්ට වත් යම් ගහක් කපන්ටවත් ගැනුම්කාරයාට හෝ ඔහුගේ වැඩකරුවන්ටවත් අවසර නැත.

4. ඒජන්ත උන්නාන්සේගෙන් කලින් ලියවිල්ලක් පිට අවසර ඇතුව මිස නැත්නම් ඉඩම යම් කෙනෙකුට පවරන්ට වත් නැවත බදුදෙන්ටවත් ගැණුම්කාරයාට අවසර නැත.

5. බදුකාරයා විසින් නාගරික සභාවේ සියලුම වරිපනම් කාසි ගෙවන්ට ඕනෑය.

6. බදුකාරයාට මාසයකට කලින් දන්වාදී වන්දියක් නැතුව නැවත ඉඩම භාරගන්ට ඒජන්ත උන්නාන්සේට හෝ ඔහුගේ බලය පිට ක්‍රියාකරන්නෙකුට බලය තිබේ.



7. මිලේට්ගත් අය විසින් ඉඩම පිරිසිදුව හොඳකාර තිබෙන්ට ඕනෑවා සහ නාගරික සභාවේ අණපනත්වලට යටත්ව ක්‍රියාකළ යුතුයි.

8. ඇලට වෙන්කර තිබෙන සීමිතිරුවෙහි ගවයින් හෝ එළුවන් බැඳ තැබීමට තහනම්ය.

9. ඒජන්ත උන්නාන්සේගේ කැමැත්ත පරිදි වුවමනා පමණ බඩු පටවන බාන ස්ථාන බදු ගැනුම්කාරයාට අලාබයක් නොගෙවා පිහිටවීමට බලය තබාගන්නවා ඇත.

10. ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් අවසරයක් නැතුව කිසිම ගොඩනැගිල්ලක් සාදන්ට බැරිය. ඉවුරට වන හානිය බදු ගැනුම්කාරයාගේ වියදමෙන් සාදවාදෙන්ට ඕනෑය.

11. ඉහත සඳහන්කරන්ට යෙදුන කොන්දේසි කඩකළොත් වන්දි මුදලක් නොදෙනවා ගැනුම්කාරයා ඉඩමෙන් අහක්කර නැවත අයිතිවාසිකම් භාරගන්ට ඒජන්ත උන්නාන්සේට බලය තිබේ.

12. යම් ඉල්ලීමක් භාරගන්ට හෝ නොගන්ට හෝ ඉල්ලුම්පත්‍ර නොඉල්ලුවාමෙන් සලකා බද්ද දීමටද ඒජන්ත උන්නාන්සේට බලය තබාගන්ට යෙදුනා ඇත.

මෙහි සඳහන් ඉඩම.

කිරිලපොනේ පාලමට දකුණෙන් එම ඇළේ බස්නාහිර ඉවුරේ පිහිටි අඩි 50×75 ප්‍රමාණ ඇලට වෙන්කර තිබෙන බිම්කට්ටියේ කොටස බඩු පැටවීමට සහ බෑමට පාවිච්චිකිරීමට වේ.

ඩබ්ලිව්. ඊ. හොඩ්ගේ,
බස්නාහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ.

වර්ෂ 1937ක්වූ ඔක්තෝබර් මස 15වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

No. L. H. 909

නොම්බර 3;385 දරණ පිල් සිතියමේ පෙනෙන U. V. W. X. Y. Z./343 A 344 යන ඉඩම්කට්ටි වර 1938ක්වූ ජනවාරි මස 1වෙනි දින සිට අවුරුදු දෙකකට බදුදීමට ඉල්ලුම්පත්‍ර බස්නාහිර දිසාවේ ඒජන්ත උන්නාන්සේ විසින් භාරගන්නා බව මෙයින් දන්වාදෙනු ලැබේ.

2. මෙම මුද්‍රකරණලද ඉල්ලුම්පත්‍ර වර්ෂ 1937ක්වූ නොවැම්බර් මස 5වෙනි සිකුරාදා දවල් 11 වනතුරු කොළඹ කච්චේරියේදී භාරගෙන එදිනදී ඒවා කඩා බලනවා ඇත. ඉල්ලුම්පත්‍ර සැබෑබවට ඔප්පුවීමට ඉල්ලුම්කරන්නාවූ සියලුදෙනාම ඒජන්ත උන්නාන්සේ ඉදිරියේ තමන්ම නොහොත් තමන් වෙනුවෙන් ක්‍රියාකරන්නෙක් පෙනීසිටින්ට ඕනෑය.

කොන්දේසි.

1. බදුමුදල් බදුගත් දිනදී බදුගැනුම්කාරයා විසින් සම්පූර්ණයෙන් ගෙවියයුතුවේ.

2. කිරිල්ලපනේ ඇළේ යන එන පහුරු, පාරු යනාදියෙන් බඩු බෑමටත්, පැටවීමටත් බිම්කට්ටි Z343 සහ A344 (පමණක්) පාවිච්චිකිරීමට බදුකාරයාට බලය තිබේ. එක පාරුවකට හෝ පහුරකට රුපියලකට වැඩිනොවන ගණනක් අයකර ගැනීමට සහ අනික් කට්ටිවල එලප්‍රයෝජනය ගැනීමටත් පමණකි.

3. බදුකාරයාට ඉහතකී ඇළ අයිනේ තිබෙන අධිපාරේ කොයිම අන්දමේ රථවාහනයක් නොනැවැත්වීමටවත් එය අවහිර කිරීමටවත්, බදුගත් ඉඩමේ දැනට තිබෙන මායිමක් හෝ වැටක් වෙනස්කිරීමටවත් නුපුළුවන.

4. බදුකාරයා විසින් බදුගත් ඉඩමේ වැට බඳින්ට ඕනෑය කියා ඒජන්ත උන්නාන්සේ විසින් අණකරන්ට යෙදුනොත් එසේ වැටවල් බඳින්ට බදුකාරයා බැඳෙනවා ඇත.

5. බදුකාරයා ඉඩම සුද්දෙන් සහ හොඳකාර තබාගන්වත් සනීපාරක්ෂක සමිතියේ අණපනත්වල හැටියට පිළිපදින්ට සහ එහි නියමවල හැටියට බදුගෙවන්ටත් ඕනෑය.

6 බදුකාරයාට මාසයකට ප්‍රථම දන්වාදී ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ හෝ ඒජන්ත උන්නාන්සේගේ බලය යටතේ ක්‍රියාකාරණ කොයිම කෙනෙකුට නුඹුත් ඉඩමේ භුක්තිය නැවත භාරගැනීමට කොයිම විටකදී නුඹුත් අයිතිවාසිකම් තබාගන්නා ඇත.

7. ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන් ලියවිල්ලකින් ලබාගන්නාලද අවසරයක් නැතුව ඉඩමේ බද්ද කිසි කෙනෙකුට පවරන්ටවත්, මාරුකරන්ටවත්, නැවත බදුදෙන්ටවත් බදුකාරයාට බලය නැත.

8. බද්ද මාරුවෙන්ට ප්‍රථමයෙන් මුළු ඉඩම හෝ ඉඩමෙන් යම් කොටසක් ආණ්ඩුවට ඕනෑකළොත් මාසයක් කල්දුන්විට ආණ්ඩුවට භාරදිය යුතුයි. එසේ නැවත භාරගනු ලැබූවිට, බද්දට ගෙවනලද මුළු මුදලත්, ඉඩමෙන් නැවත භාරගත් ප්‍රමාණයත්, බද්දේ ඉදිරියට ගතවෙන්ට තිබෙන කාලයත්, යන මේ කරුණු සලකාබලා, බදු මුදලෙන් සෑහෙන කොටසක් බදුකාරයාට ආපසු ගෙවනු ලැබේ.

9. ඉහත සඳහන්වන කොන්දේසි කඩකළොත් වන්දි මුදලක් නොගෙවා බදු ගැනුම්කාරයා සහ ඔහුගේ වැඩකරුවන් ඉඩමෙන් අහක්කර ඉඩමේ භුක්තිය ආණ්ඩුවේ ඒජන්ත උත්තමයාණන්ට නැවත ගැනීමට බලය තිබේ.

10. යම්කිසි ඉල්ලුම්පත්‍රයක් හෝ සියළුම ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂෙපකිරීමේ බලය ඒජන්ත උත්තමයාණන් වෙත තබා ගන්නා ඇත.

ඩබ්ලිව්. ඒ. ගොබ්බෙ,
බස්නාහිර දිසාවේ ඒජන්තතුමා.

වර්ෂ 1937ක්වූ ඔක්තෝබර් මස 15වෙනි
කොළඹ කච්චේරියේදීය.

---

## 1920සේ නොම්මර 11 දරණ ප්‍රදේශික ආණ්ඩු ව්‍යවස්ථාව.

### දෙහිවල-ගල්කිස්ස නගරබද පලාත් ආණ්ඩු සභාවේ සාමාජිකයින් තේරීම.

වර්ෂ 1937ක්වූ ඔක්තෝබර් මස 1වෙනි දින ප්‍රසිඩකරනලද නො. 8,321 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි ප්‍රසිඩකරනලද වර්ෂ 1937ක්වූ සැප්තැම්බර් මස 28වෙනි දින දරණ දැන්වීම මෙහි පහත පෙන්නුම්කරන ප්‍රකාර වෙනස්කල බව මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධියට පමුණුවනු ලැබේ.

ඡන්දයගන්නා ස්ථානය—නො. 3 කරගම්පිටිය.

ක්‍රයිස්ට් චර්ච් පිරිමි පාඨශාලාව, දෙහිවල.

වෙනුවට

දෙහිවල ඇල්බට් ප්ලේස්හි එච්. ජේ. පීරිස් මහතාට අයිති ගබුඩාන පාරේ පිහිටි නො. 257 දරණ ඉඩමේ තාවකාලික මඩුව යනුයි.

වර්ෂ 1920 අංක 11 දරණ ආඥාපනතේ 30 (2) වගන්තියේ ප්‍රකාර මෙම වෙනස්කිරීමේ දැන්වීම ප්‍රසිඩකරනලදී.

ඇස්. ඇෆ්. අමරසිංහ,
බස්නාහිර පලාතේ දිසාපතිතුමා වෙනුවට.

වර්ෂ 1937ක්වූ ඔක්තෝබර් මස 9වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

### මාතර නගරබද පලාතේ ආණ්ඩුසභාව, ත්‍රෛවාර්ෂික තේරීම.

මාතර නගරබද පලාත් ආණ්ඩු සභාවේ සාමාජිකවරුන් තේරීමක් වර්ෂ 1937 නොවැම්බර් මස 20වෙනි සෙනසුරාදා පැවැත්වීමට අදහස්කර තිබෙන බව මෙයින් දන්වනු ලැබේ.

සාමාජිකත්වයකට ඉදිරිපත්වන එක එක අයගේ නම ලියවිල්ලකින් යෝජනාකළ යුතුය. එක එක යෝජනා පත්‍රය සාමාජිකත්වය ඉල්ලා සිටින කොට්ඨාශයේ, ඡන්දදීමට සුදුසු අයවලුන්ගේ නාම ලේඛනයේ ඇතුලත් අයවලුන්ගෙන් අඩු වශයෙන් දෙදෙනෙකු විසින්වත් අත්සන්කර තිබෙන්ට ඕනෑය.

වර්ෂ 1937 නොවැම්බර් මස 20වෙනි සෙනසුරාදා පෙරවරු 9ටත් 10ටත් අතර සියලුම නාම යෝජනා පත්‍ර මාතර උප දිසාපතිතුමා වෙත මාතර නගරබද පලාත් ආණ්ඩු සභා කාර්යාලයේදී භාරදිය යුතුය.

2. යම් කොට්ඨාශයකට සුදුසු එක ඉල්ලුම්කරුවෙකුට වැඩි ගනනක් යෝජනාකරනු ලැබුවොත් නම්, නො. 2, 3, 6 සහ 8 යන කොට්ඨාශ වෙනුවෙන් වර්ෂ 1937 දෙසැම්බර් මස 4වෙනි සෙනසුරාදා, නො. 1, 4, 5 සහ 7 යන කොට්ඨාශ වෙනුවෙන් වර්ෂ 1937 දෙසැම්බර් මස 7වෙනි අඟහරුවාදාද පහත සඳහන් කොට්ඨාශවලදී ඡන්දය විමසනු ලැබේ.

3. ඡන්දය විමසීමට නියමිත දිනයෙහි පෙරවරු 8.30ට පටන්ගෙන පස්වරු 4ට අවසාන කරනු ලැබේ.

ඡන්දපොලවල්.

| | |
|---|---|
| නො. 1සේ කොට්ඨාශයට | මාතර කච්චේරිය. |
| නො. 2සේ කොට්ඨාශයට | පල්ලිමුල්ලේ වැස්ලියන් පාඨශාලාව. |
| නො. 3සේ කොට්ඨාශයට | වේරගම්පිට බෞද්ධ පාඨශාලාව. |
| නො. 4රේ කොට්ඨාශයට | උයන්වත්තේ පීඩබ්ලිව්ඩියේ බංගලාව. |
| නො. 5සේ කොට්ඨාශයට | මාතර නගරබද පලාත් ආණ්ඩු සභා කාර්යාලය. |
| නො. 6යේ කොට්ඨාශයට | ගබඩාවීදියේ ජේසකම් පාඨශාලාව. |
| නො. 7සේ කොට්ඨාශයට | නූපේ ප්‍රයිබ සබ බංගලාව |
| නො. 8වේ කොට්ඨාශයට | පම්බුරන බෞද්ධ පාඨශාලාව. |

ජී. ඇල්. බී. බෙම්බියන්,
උප දිසාපතිතුමා.

1937ක්වූ ඔක්තෝබර් මස 11වෙනි දින
මාතර කච්චේරියේදීය.

---

## රා සහ අරක්කු තැබෑරුම් සම්බන්ධ වර්ෂ 1912ගේ අංක 8 දරණ ව්‍යවස්ථාව යටතේ දැන්වීම.

### රත්නපුර දිස්ත්‍රික්කයේ රක්වාන ටවුමේ රා සහ අරක්කු තැබෑරුම් නැවත විවෘතකිරීම පිණිස ඡන්දය විමසීම ගැන දැන්වීමයි.

සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්තතුමාට වර්ෂ 1925ක්වූ අගෝස්තු මස 14වෙනි දින නො. 7,478 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිඩකර තිබෙන නො. 146 දරණ සුරාබදු දැන්වීමේ 6වෙනි රෙගුලාසියෙන්ද, එය ප්‍රතිසංස්කරණය කරනලද නො. 180, 187, 194, 221, 225 සහ 231 දරණ සුරාබදු දැන්වීම්වලින්ද ලැබී තිබෙන බලය පිට පහත සඳහන් දින සහ වේලාව තුලදී, රක්වාන නගරයේ රා සහ අරක්කු තැබෑරුම් නැවත විවෘතකිරීමට මෙහි පහත සඳහන් කොට්ඨාසයතුල පදිංචි ඡන්දදීමට හැකි අයවළුන්ගේ අන්තිම ලැයිස්තුවේ සඳහන් අයවළුන්ගෙන් සියයට හැටක් (60%) කැමතිද යන්න දැනගැනීම පිණිස එතුමා විසින් එකී ඡන්දදායකයන්ගේ ඡන්දය විමසන බව මෙයින් දැනුම්දෙමි.

| තැබෑරුමේ නම. | දිනය සහ වේලාව. | ඡන්දය විමසන ස්ථානය. | කොට්ඨාශය. |
|---|---|---|---|
| 1. රක්වානේ රා තැබෑරුම<br>2. රක්වානේ අරක්කු තැබෑරුම | වර්ෂ 1937 දෙසැම්බර් මස 8වෙනි දින උදේ 8මේ සිට දවල් 12 දක්වා සහ ප. ව. 1සේ සිට 6 දක්වාත්ය | රක්වානේ පොලිස් උසාවිය | අටකලන්කෝරළේ මැදපත්තුවේ රක්වාන වංම, රක්වාන සතිපොළ, රක්කා නගරය සහ මස්සිඹුල වියන්ව යහලවෙල ගම |

වර්ෂ 1937 ඔක්තෝබර් මස 9වෙනි දින
රත්නපුරේ කච්චේරියේදීය.

ආර්. ඇස්. වී. පෝලියර්,
සබරගමු පලාතේ ආණ්ඩුවේ ඒජන්තතුමා.

---

## අන්‍ය දැන්වීමයි.

මාතලේ නගරයේ ත්‍රිකුණාමලේ වීදියේ අංක 127 දරන ස්ථානයේ පදිංචි හපුතන්ත්‍රීගේ නදන් ජේම්ස් ගුණසේකර වන මම, වර්ෂ 1907 අංක 1 දරන ආඥාපනතේ 6වෙනි වගන්තියේ ප්‍රකාර, මාතලේ දිස්ත්‍රික්කයේ උතුරු කොට්ඨාසයේ දඹුල්ලේ ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකුමෙන් සිංහල භාෂාවෙන් කටයුතු කිරීමට පත්කරනු ලැබීම පිණිස මෙවක් පටන් තුන් මාසයකින් පසු රිජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලුම්කරන්ට අදහස්කරගෙන සිටින බව එකී ආඥාපනතේ 1වෙනි ඇඩිසුල් පත්‍රයේ "B." අක්ෂරය දරණ කොටසේ අංක (2) දරන වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම්දෙමි.

මීට,
එච්. ඩී. ජේ. ගුණසේකර.

16. 9. 1937, මාතලේදීය.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.